# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/4/4/67 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.09. 14 |
|---|---|---|---|---|---|

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා)
සියළුම දෙපාර්තමේන්තු /ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,

.....................................................

**ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු- ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2022.09.12 දරණ PS/FSD/Circular/13/2022 අංක දරණ චක්‍රලේඛය හා බැඳේ.

02. ඒ අනුව ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීම හා ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීම මැයෙන් ගරු ජනාධිපතිතුමා විසින් සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පිළිවෙලින් අංක 22/1360/601/005 හා 2022.09.05 දිනැති සහ අංක 22/1282/605/007 හා 2022.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ස්ථාපිත කොට ඇති ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ බහු-ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් අඩංගු කර චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

03. රටේ සියළුම පවුල් දරිද්‍රතාවයෙන් මුදවාගෙන ආහාර සුරක්ෂිතාවය තහවුරු කොට මන්දපෝෂණ තත්වයෙන් දරුවන් මුදවා ගැනීම සඳහා කඩිනම් ජාතික බහු-ආශික ඒකාබද්ධ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහනක් රජය විසින් සැළසුම් කොට ඇති අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ජනාධිපතිවරයාගේ සිට ග්‍රාම නිලධාරී මට්ටමේ නිලධාරීන් ඇතුළත් වන පරිදි සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය මෙන්ම පෞද්ගලික අංශය,රාජ්‍ය නොවන සංවිධාන ,වෘත්තිකයන්, ආගමික නායකයින්, දේශපාලඥයින් යන පුද්ගලයන් ඇතුළත් වන බහු- ආශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇති බව සඳහන් කර ඇත. මෙම බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය ජාතික,පළාත්,දිස්ත්‍රික්,ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් 2022.09.23 දිනට පෙර කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

04. ඒ සඳහා ඔබ අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ දෙපාර්තමේන්තු,ව්‍යවස්ථාපිත ආයතනයන්හි අදාල නිලධාරීන් සක්‍රියව සම්බන්ධ කරවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වන අතර ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සම්බන්ධ වැඩසටහන් සඳහා ද සක්‍රීයව දායකවීමට දැනුවත් කරන ලෙස ද කාරුණිකව වැඩිදුරටත් දන්වමි.

05. ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය www.cs.sp.gov.lk මඟින් බා ගත හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්:
1.ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.ස
2.ආණ්ඩුකාර ලේකම්, දකුණු පළාත - කාරු.දැ.ගැ.ස සහ ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය :- PS/FSD/Circular(2022)/01

චක්‍රලේඛ අංකය - PS/FSD/Circular/13/2022

2022 සැප්තැම්බර් මස 12 දින

සියළු අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ප්‍රධාන ලේකම්වරු,
ආණ්ඩුකාර ලේකම්වරු,
දිස්ත්‍රික් ලේකම්වරු,
ප්‍රාදේශීය ලේකම්වරු.

**ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු-ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය**

ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීම සහ ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීම මැයෙන් ගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පිළිවෙලින් අංක 22/1360/601/005 හා 2022.09.05 දිනැති සහ අංක 22/1282/605/007 හා 2022.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ස්ථාපිත කොට ඇති ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ බහු-ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කරනු ලැබේ.

රජයේ ආහාර සුරක්ෂිතතා වැඩසටහනේ දැක්ම වන්නේ,

"සෑම පුරවැසියෙකුටම රටෙහි පවතින ඕනෑම තත්ත්වයකදී වුවද ක්‍රියාශීලී නිරෝගී දිවිපැවැත්මකට අවශ්‍ය ප්‍රමාණවත් ආහාර සාධාරණ මිළකට ලබාගැනීමට හැකිවීමයි".

02. මෙම දැක්ම අනුව රටේ කිසිදු පුරවැසියෙක් ආහාර නොමැතිකම නිසා කුසගින්නේ නොතැබිය යුතුයි. කිසිදු දරුවෙක් මන්දපෝෂණ තත්ත්වයට ගොදුරු නොවිය යුතුයි. මෙම අරමුණු දෙක ඉටුකර ගැනීමට නම් රටේ සියළුම පවුල් දරිද්‍රතාවයෙන් මුදවාගත යුතුයි. ඒ අනුව සියළුම පවුල් දරිද්‍රතාවයෙන් මුදවාගෙන ආහාර සුරක්ෂිතතාවය තහවුරු කොට මන්දපෝෂණ තත්ත්වයෙන් දරුවන් මුදවා ගැනීම සඳහා කඩිනම් ජාතික බහු-ආංශික ඒකාබද්ධ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහනක් රජය විසින් සැළසුම්කොට ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ජනාධිපතිවරයා සහ ගරු අගමැතිවරයාගේ සිට ග්‍රාම නිලධාරී මට්ටමේ නිලධාරීන් ඇතුළත් වන පරිදි සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය මෙන්ම පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තිකයන්, ආගමික නායකයින්, දේශපාලනඥයින් යන පුද්ගලයන් ඇතුළත්වන බහු-ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් පහත සඳහන් පරිදි හඳුන්වා දී ඇත.

**2.1 ජාතික ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ සභාව**

ජාතික ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහනෙහි ජාතික මට්ටමේ බහු-ආංශික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, ජාතික ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ සභාව මගින් අපේක්ෂා කෙරේ. ජාතික ආහාර



ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

සුරක්ෂිතතා සහ පෝෂණ සභාව විසින් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය සහ මඟ පෙන්වීම කරනු ලබයි.

ජාතික ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ සභාවෙහි සංයුතිය පහත පරිදි වේ.

i. ගරු ජනාධිපති (සභාපති)
ii. ගරු අග්‍රාමාත්‍ය
iii. සෞඛ්‍ය සහ පෝෂණය විෂය භාර අමාත්‍ය
iv. කෘෂිකර්ම සහ පශු සම්පත් විෂය භාර අමාත්‍ය
v. ධීවර විෂය භාර අමාත්‍ය
vi. සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීම විෂය භාර අමාත්‍ය
vii. අධ්‍යාපන විෂය භාර අමාත්‍ය
viii. වැවිලි විෂය භාර අමාත්‍ය
ix. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය
x. මුදල් සහ ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍ය
xi. ජනමාධ්‍ය විෂය භාර අමාත්‍ය
xii. කාන්තා හා ළමා කටයුතු විෂය භාර අමාත්‍ය
xiii. ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍ය
xiv. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ විෂය භාර අමාත්‍ය
xv. වෙළඳ හා වාණිජ කටයුතු විෂය භාර අමාත්‍ය
xvi. ජල සම්පාදන විෂය භාර අමාත්‍ය
xvii. ඉහත විෂයන් සම්බන්ධයෙන් අදාළවන රාජ්‍ය අමාත්‍යවරුන්
xviii. සියලුම පළාත් ආණ්ඩුකාරවරුන්
xix. ආහාර සහ පෝෂණය පිළිබඳ දැනුමක් ඇති දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
xx. ආහාර සුරක්ෂිතතා සහ පෝෂණය සභාව මඟින් ආරාධනා කරනු ලබන පෞද්ගලික අංශයේ නියෝජිතයින් සහ වෘත්තිකයින්

කැඳවුම්කරු - ප්‍රධානි, ආහාර සුරක්ෂිතතා අංශය, ජනාධිපති කාර්යාලය.

රැස්වීම - තෙමසකට වරක්

**2.2 ආහාර සුරක්ෂිතතා හා පෝෂණය පිළිබඳ ජාතික ඒකාබද්ධ යාන්ත්‍රණය.**

ජාතික ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන්වල ප්‍රතිපත්ති මට්ටමේ බහු-ආංශික සම්බන්ධීකරණය කිරීම සඳහා ආහාර සුරක්ෂිතතා හා පෝෂණ පිළිබඳ ජාතික ඒකාබද්ධ යාන්ත්‍රණය පහත සඳහන් පරිදි ස්ථාපනය කෙරේ.

i. ජනාධිපති ලේකම් (සභාපති)
ii. අග්‍රාමාත්‍ය ලේකම්
iii. ලේකම්, සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය
iv. ලේකම්, කෘෂිකර්ම සහ පශු සම්පත් විෂය භාර අමාත්‍යාංශය
v. ලේකම්, ධීවර විෂය භාර අමාත්‍යාංශය
vi. ලේකම්, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීම විෂය භාර අමාත්‍යාංශය

vii. ලේකම්, අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය
viii. ලේකම්, වැවිලි විෂය භාර අමාත්‍යාංශය
ix. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය
x. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යාංශය
xi. ලේකම්, ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශය
xii. ලේකම්, කාන්තා හා ළමාකටයුතු විෂය භාර අමාත්‍යාංශය
xiii. ලේකම්, ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය
xiv. ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ විෂය භාර අමාත්‍යාංශය
xv. ලේකම්, වෙළඳ හා වාණිජ කටයුතු විෂය භාර අමාත්‍යාංශය
xvi. ලේකම්, ජල සම්පාදන විෂය භාර අමාත්‍යාංශය
xvii. සියලු පළාත්වල ප්‍රධාන ලේකම්වරුන්
xviii. සිවිල් සමාජ නියෝජිතයින්
xix. සංවර්ධන පාර්ශවකරුවන්ගේ නියෝජිතයින්
xx. විද්වතුන් හා වෘත්තිකයින්
xxi. ප්‍රධානී, හරිත කෘෂිකර්ම මෙහෙයුම් මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය
xxii. ජාතික ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ පිළිබඳ ඒකාබද්ධ යාන්ත්‍රණය විසින් ආරාධනය කරනු ලබන වෙනත් පුද්ගලයින්

කැඳවුම්කරු - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

රැස්වීම - දෙමසකට වරක්

**2.3. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව**

ආහාර සුරක්ෂිතතා සහ පෝෂණය වැඩසටහන්වල තාක්ෂණික මට්ටමේ සම්බන්ධීකරණය සඳහා තාක්ෂණික උපදේශන කමිටුව ස්ථාපනය කරන අතර මෙම කමිටුවට පහත සඳහන් වගකීම් පවරා ඇත.

- ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සම්බන්ධ තාක්ෂණික හා ප්‍රතිපත්තිමය ගැටලු සමාලෝචනය කිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සැලසුම්, උපාය මාර්ග හා වැඩසටහන් සකස් කිරීම.
- ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය කිරීම සහ ආහාර සුරක්ෂිතතා හා පෝෂණය සඳහා වන ජාතික ඒකාබද්ධ යාන්ත්‍රණය වෙත වාර්තා කිරීම.

ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i. අග්‍රාමාත්‍ය ලේකම් (සභාපති)
ii. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
iii. අධ්‍යක්ෂජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව
iv. අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
v. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ix. අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව

x. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය

xi. කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

xii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

xiii. අධ්‍යක්ෂ ජනරාල්, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

xiv. අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නියෝජිතායතනය

xv. අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

xvi. ආරක්ෂක අමාත්‍යාංශයේ හරිත කෘෂිකර්ම මෙහෙයුම් මධ්‍යස්ථාන නියෝජිතයෙකු

xvii. අවශ්‍යතාව අනුව ආහාර සුරක්ෂිතතා සහ පෝෂණය සඳහා වන තාක්ෂණික උපදේශන කමිටුව විසින් පත් කරන ලද අදාළ ක්ෂේත්‍රයන්හි තාක්ෂණික විශේෂඥයින්

xviii. විද්වතුන් සහ වෘත්තිකයින්

xix. වාණිජ මණ්ඩල නියෝජිතයින් (පෞද්ගලික අංශයේ නියෝජනය සඳහා)

xx. රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන නියෝජිතයින්

කැඳවුම්කරු - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රජා සෞඛ්‍ය සේවා / පෝෂණ (සෞඛ්‍ය අමාත්‍යාංශය)

රැස්වීම - දෙමසකට වරක්

### 2.4. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන පළාත් ඒකාබද්ධ යාන්ත්‍රණය

ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ පළාත් මට්ටමේ බහු-ආංශික සම්බන්ධීකරණය කිරීම සහ එහි ප්‍රගතිය සහ ගැටලු පිළිබඳව ජාතික ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ සභාව වෙත වාර්තා කිරීම සඳහා සෑම පළාතකටම ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන පළාත් ඒකාබද්ධ යාන්ත්‍රණය බැගින් ස්ථාපනය කෙරේ. පළාත් ඒකාබද්ධ යාන්ත්‍රණයට පහත සඳහන් වගකීම් පවරා ඇත.

- පළාත් සඳහා විශේෂිත ආහාර හා පෝෂණ උපාය මාර්ගයන් හඳුනාගැනීම, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන් සඳහා මඟ පෙන්වීම.
- අවශ්‍ය අවස්ථාවන්හිදී අනෙකුත් කමිටු වෙත ප්‍රගතිය හා ගැටලු පිළිබඳව වාර්තා කිරීම
- වාර්ෂික පළාත් සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

පළාත් ඒකාබද්ධ යාන්ත්‍රණයේ සංයුතිය පහත පරිදි වේ.

i. ගරු පළාත් ආණ්ඩුකාරවරු (සභාපති)

ii. ප්‍රධාන ලේකම්

iii. අදාළ දිස්ත්‍රික් ලේකම්වරු

iv. නගරාධිපති/ සභාපති (මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා)

v. ආණ්ඩුකාර ලේකම්

vi. පළාත් අමාත්‍යාංශ ලේකම්වරු

vii. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

viii. පළාත් පාලන කොමසාරිස්
ix. ආයුර්වේද කොමසාරිස්
x. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
xi. පළාත් ඉඩම් කොමසාරිස්
xii. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
xiii. පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ
xiv. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
xv. සමූපකාර සංවර්ධන කොමසාරිස්
xvi. පළාත් පශු සම්පත් සංවර්ධන අධ්‍යක්ෂ
xvii. නේවාසික ව්‍යාපෘති කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
xviii. නියෝජිත, හරිත කෘෂිකර්ම මෙහෙයුම් මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය
xix. විද්වතුන් හා වෘත්තිකයින්
xx. ව්‍යාපාර ප්‍රජාවේ නියෝජිතයින්
xxi. රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ නියෝජිතයින්
xxii. වෙනත් (කමිටුව විසින් තීරණය කරන පරිදි)

කැඳවුම්කරු - පළාත් ප්‍රධාන ලේකම්
රැස්වීම - මාසිකව

**2.5.** ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණය

දිස්ත්‍රික් ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම, අධ්‍යයනය කිරීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකටම එක් යාන්ත්‍රණයක් වශයෙන් ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණයන් ස්ථාපනය කෙරේ. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණයට පහත සඳහන් වගකීම් පවරා ඇත.

- දිස්ත්‍රික්කය තුළ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් අදාළ දිස්ත්‍රික්කය තුළ ආහාර සුරක්ෂිතතාව සහතික කරමින් මන්දපෝෂණය තුරන් කිරීම.
- සමස්තයක් ලෙස දිස්ත්‍රික්කය තුළ ආහාර සහ පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා සුදුසු නිර්ණායක මත පදනම් වූ මැදිහත්වීම් හඳුනාගැනීම, සැලසුම් කිරීම සහ ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
- ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ලබාගත් ප්‍රගතිය අධීක්ෂණය කිරීම, තක්සේරු කිරීම, ඒ හා සම්බන්ධ සැලසුම් සහ උපාය මාර්ගයන් යාවත්කාලීන කිරීම.

ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණය පහත පරිදි වේ.

i. දිස්ත්‍රික් ලේකම් (සභාපති)
ii. අතිරේක දිස්ත්‍රික් ලේකම්
iii. අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)

iv. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
v. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරු
vi. පළාත් ආයුර්වේද කොමසාරිස්
vii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
viii. ප්‍රජා වෛද්‍ය උපදේශක
ix. මාතෘ සහ ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
x. පශු වෛද්‍ය නිලධාරී
xi. සංඛ්‍යාලේඛනඥ
xii. කෘෂිකර්ම අධ්‍යක්ෂ
xiii. ධීවර අධ්‍යක්ෂ
xiv. සමෘද්ධි අධ්‍යක්ෂ
xv. වාරිමාර්ග අධ්‍යක්ෂ
xvi. සහකාර ගොවිජන සේවා කොමසාරිස්
xvii. දිස්ත්‍රික් පරිවාස හා ළමා ආරක්ෂණ නිලධාරී
xviii. ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරී/ මුල් ළමාවිය සංවර්ධන නිලධාරී/ කාන්තා සංවර්ධන නිලධාරී/ විද්‍යා නිලධාරී/ තොරතුරු නිලධාරී
xix. නියෝජිත, හරිත කෘෂිකර්ම මෙහෙයුම් මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය
xx. ව්‍යාපාර ප්‍රජාවේ නියෝජිතයින්
xxi. රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ නියෝජිතයින් (ගොවි සහ ධීවර සංවිධාන නියෝජිතයින් ඇතුළුව)
xxii. වෙනත් සුදුසු නියෝජිතයින්

කැඳවුම්කරු - අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
රැස්වීම - මාසිකව

**2.6. ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ ප්‍රාදේශීය ඒකාබද්ධ යාන්ත්‍රණය**

ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම එක් යාන්ත්‍රණයක් වශයෙන් ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන ප්‍රාදේශීය ඒකාබද්ධ යාන්ත්‍රණ ස්ථාපනය කෙරේ. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන ප්‍රාදේශීය ඒකාබද්ධ යාන්ත්‍රණයට පහත සඳහන් වගකීම් පවරා ඇත.

- ගෘහස්ථ මට්ටමෙන් ජීවනෝපාය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම නිලධාරී වසම්වල ඇති ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන සහ ආහාර සුරක්ෂිත කමිටු සඳහා මඟ පෙන්වීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පෝෂණීය වශයෙන් අවදානම් තත්ත්වයක ඇති ගෘහ ඒකක ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හඳුනාගැනීම, එවැනි ගෘහ ඒකකවල ආහාර හා පෝෂණ තත්ත්වය නඟා සිටුවීම වෙනුවෙන් අවශ්‍ය වන ප්‍රතිඵල මත පදනම් වූ මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීම

- සමස්තයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආහාර සුරක්ෂිතතා සහ පෝෂණ තත්ත්වයන් නංවාලීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිඵල මත පදනම් වූ මැදිහත් වීම් හඳුනාගැනීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ආහාර සුරක්ෂිතතා හා පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ළඟා කරගත් ප්‍රගතිය අධීක්ෂණය කිරීම, තක්සේරු කිරීම සහ මාසිකව දිස්ත්‍රික් ඒකාබද්ධ යාන්ත්‍රණය වෙත වාර්තා කිරීම.

ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන ප්‍රාදේශීය ඒකාබද්ධ යාන්ත්‍රණයේ සංයුතිය පහත පරිදි වේ.

i. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
ii. පළාත් පාලන නියෝජිතයින් ( නගර සභා හා ප්‍රාදේශීය සභා)
iii. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
iv. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
v. ලේකම්/ කොමසාරිස් (ප්‍රාදේශීය / නගර /මහ නගර සභා)
vi. රජයේ පශු වෛද්‍ය නිලධාරී
vii. ආයුර්වේද වෛද්‍ය නිලධාරී
viii. වාරිමාර්ග ව්‍යාපාරවල නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්
ix. ප්‍රදේශීය ගොවිජන සංවර්ධන නිලධාරී
x. කෘෂිකර්ම උපදේශක
xi. ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරී/මුල් ළමාවිය සංවර්ධන නිලධාරී/ කාන්තා සංවර්ධන නිලධාරී/ සමාජ සේවා නිලධාරී/ පරිවාස නිලධාරී
xii. සංඛ්‍යාන නිලධාරී
xiii. සමෘද්ධි කළමනාකරු
xiv. කළමනාකරුවන් / වැඩිහිටි නිවාස
xv. කළමනාකරුවන් / ළමා නිවාස
xvi. රාජ්‍ය නොවන සහ සිවිල් සංවිධාන නියෝජිතයින් (ගොවි සහ ධීවර සංවිධාන ඇතුලත්ව)
xvii. මූල්‍ය ආයතන / වානිජ බැංකු නියෝජිතයින්
xviii. වෙනත් සුදුසු නියෝජිතයින්

කැඳවුම්කරු - සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
රැස්වීම - මාසිකව

## 2.7. ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 09/2022 හා 2022.09.06 දිනැති ග්‍රාම නිලධාරී වසම්, ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර වශයෙන් කඩිනමින් සවිබල ගැන්වීම මැයෙන් ඉදිරිපත්කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර ස්ථාපිත කොට ඇත. මෙම ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන සහ ආහාර සුරක්ෂිතතා කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

I. ආර්ථික සංවර්ධන නිලධාරී

II. ග්‍රාම නිලධාරී
III. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී
IV. සමෘද්ධි සංවර්ධන නිලධාරී
V. කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර
VI. පාසල්වල විදුහල්පතිවරුන්
VII. රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් සහ සිවිල් සමාජ (ගොවි සහ ධීවර සංවිධාන ඇතුළුව)
VIII. ආගමික සංවිධානවල නියෝජිතයින්
IX. වෙනත් (කමිටුව විසින් තීරණය කරන පරිදි)

කමිටුව විසින් ග්‍රාම නිලධාරී වසම තුළ ආර්ථික පුනර්ජීවනය ඇතිකොට දරිද්‍රතාව පිටුදැකීම, මන්දපෝෂණයෙන් දරුවන් මුදවා ගැනීම, ප්‍රදේශයේ ආහාර සුරක්ෂිතතාවය මෙන්ම ජීවන තත්ත්වය ඉහළ නැංවිය යුතුයි. මෙම කමිටුව මාසිකව රැස්වී පහත සඳහන් ඉලක්ක ළඟා කර ගත යුතුය.

- තම වසම තුළ කිසිදු පවුලක් හෝ පුද්ගලයෙක් ආහාර ලබාගැනීමට නොහැකිවීම නිසා කුසගින්නේ නොසිටිය යුතු බවට වග බලා ගත යුතුයි.
- තම ග්‍රාම නිලධාරී වසමේ කිසිදු දරුවෙක් මන්දපෝෂණයෙන් නොපෙළෙන බවට වග බලා ගැනීම.
- තම වසමේ සියලු පවුල් සහ පුද්ගලයින් ජාත්‍යන්තර දරිද්‍රතා මට්ටමෙන් ඉහලට ඔසවා තැබීම.
- සුදුසු කෘෂිකාර්මික, වෙළඳ, ආර්ථික, පාරිසරික සහ සමාජීය වැඩසටහන් සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධකර ගනිමින් ක්‍රියාත්මක කිරීම.
- අවසාන වශයෙන් තම වසම ආහාර සුරක්ෂිතතාව තහවුරු කළ සහ මන්දපෝෂණය තුරන් කළ වසමක් බවට අභිමානයෙන් ප්‍රකාශයට පත්කිරීම.
- ඉහත අරමුණු ඉටුකර ගැනීමට අපහසු නම් එයට අදාළ හේතු ප්‍රාදේශීය ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සඳහා වන ඒකාබද්ධ යාන්ත්‍රණය වෙත යොමු කිරීම.

03. ප්‍රාදේශීය ලේකම් විසින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන සහ ආහාර සුරක්ෂිතතා කමිටු ස්ථාපිත කොට කමිටු සාමාජිකයන් පත්කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් කමිටුවේ මෙහෙයුම්කරු සහ කැඳවුම්කරු සුදුසු පරිදි නම් කළ යුතුය.

04. මෙම වැඩසටහන සඳහා ප්‍රදේශයේ සියලුම ආගමික ස්ථාන, රාජ්‍ය, රාජ්‍ය නොවන, පුද්ගලික බැංකු හා පාසල් ඇතුළු අදාළ සියලුම පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමට හැකිවන පරිදි වැඩසටහන් සකස් කළ යුතුය.

05. ග්‍රාම නිලධාරී වසම් තුළ එක් එක් පවුල් සහ පුද්ගලයින් ක්‍රියාත්මක කරන ආහාර නිෂ්පාදන, සැකසීම්, සහ බෙදාහැරීම් හෝ වෙනත් ආර්ථික කටයුතු පෙර සූදානමක් ඇතිව සැලසුම් කර ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය, ඉන්ධන, බීජ, පොහොර ඇතුළු කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය වෙලාවට ප්‍රමාණවත් පරිදි සාධාරණ මිලකට ලබාදීමට සැලසුම් කල යුතුය.

06. මේ සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් තුලින් කටයුතු කිරීමෙන් කාර්යක්ෂමතාවය වැඩිකර ගත හැකිය. මේ සඳහා කමිටුවේ නිලධාරීන්, වසමේ සියලුම ගෘහ මූලිකයින් සමග සාකච්ඡා කොට එක් එක් ගෘහ ඒකකවල ඉදිරි වගා කන්නවල නිෂ්පාදන සැලසුම් සහ ඒ සඳහා අවශ්‍ය යෙදවුම් ප්‍රමාණයන්, බෝග වර්ග,

වගා වපසරිය, අපේක්ෂිත අස්වැන්න, අලෙවිකරණ උපාය මාර්ග වැනි දත්ත ගෘහ ඒකක මට්ටමෙන් සකස් කළ යුතුය.

07. වසමේ එක් එක් ගෘහ ඒකකවල සැලසුම් එකතු කොට වසමට අවශ්‍ය සියලු කෘෂි යෙදවුම් පිළිබඳ තක්සේරුවක් පිළියෙල කොට නිසි කලට සියලු පවුල්වලට අවශ්‍ය යෙදවුම් ලබාදීමට කටයුතු සම්පාදනය කිරීමටත් ඔවුන් අස්වනු නෙලන කාලයට නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පහසුකම් සැළසිය යුතුය.

08. ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට සියලු ගෘහ ඒකකවල නිෂ්පාදන දත්ත මාර්ගස්ථ ක්‍රමයට මාසිකව උඩුගත (Upload) කිරීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

09. ග්‍රාම නිලධාරී වසම තුළ කෘෂිකාර්මික දත්ත නිසිකලට නිරවද්‍යව ලබාගැනීම, නිවැරදි තීන්දු හා තීරණ ගැනීමට අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා අදාළ දත්ත, වසම් තුළ එක්රැස් කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ යථාකාලයේ දී මෙම කමිටු වෙත නිකුත් කරනු ලැබේ. ඒ අනුව ජනාධිපති කාර්යාලයේ ආහාර සුරක්ෂිතතා අංශය මගින් සකස් කොට ඇති වෙබ් අඩවිය හා ජංගම යෙදවුමට (Mobile App) මාර්ගගත ක්‍රමය ඔස්සේ වසමෙහි ආහාර සුරක්ෂිතතා දත්ත උඩුගත (Upload) කළ යුතුය.

10. තවද, මෙම චක්‍රලේඛය මඟින් යෝජිත බහු-ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයන් ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් 2022 සැප්තැම්බර් 23 දිනට පෙර පිහිටුවා අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

ඊ.එම්.එස්.බී.ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත්:-

01. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
02. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - කාරුණික දැනගැනීම සඳහා